# ප්‍රසම්පාදන දැන්වීම

## දකුණු පළාත් අධ්‍යාපන, ඉඩම් හා ඉඩම් සංවර්ධන,මහා මාර්ග හා ප්‍රවෘත්ති අමාත්‍යාංශය

## දකුණු පළාත් සභාව

ළඟම පාසල හොඳම පාසල ජාතික වැඩසටහන යටතේ ක්‍රියාත්මක කරනු ලබන පහත සඳහන් වැඩ යෝජනාව සඳහා සුදුසුකම් ලත් කොන්ත්‍රාත්කරුවන්ගෙන්,දකුණු පළාත් අධ්‍යාපන අමාත්‍යාංශයේ ප්‍රසම්පාදන කමිටු සභාපති විසින් ලංසු පත් කැඳවනු ලැබේ.

| අනු අංකය | ව්‍යාපෘති අංකය | පාසල | වැඩ විස්තරය | අවශ්‍ය CIDA ලියාපදිංචිය | ආපසු නොගෙවනු ලබන ඇප තැන්පත් (රු.) | ලංසු ඇපකර වටිනාකම (රු.) | මුළු පිරිවැය ඇස්තමේන්තු මුදල (රු.මි) |
|---|---|---|---|---|---|---|---|
| 01 | M/C/ NSBS/25/08 | මාර/කුමාරතුංග මුණිදාස ම.වි | 90*25 තෙමහල් ගොඩනැගිල්ල ඉදි කිරීම (අවසන් අදියර) | C5 හෝ ඉහළ | 20,000.00 | 740,000.00 | 99.62 |

02. ජාතික තරඟකාරී ලංසු පටිපාටිය මත ලංසු ඉදිරිපත් කල යුතුය.කොන්ත්‍රාත් ප්‍රදානයේදී සුදුසුකම් ලබන සාර්ථක ලංසුකරුවන් අසාධු ලේඛනගත නොවිය යුතු අතර ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරියේ ඉහත කාණ්ඩ යටතේ ලියාපදිංචි වී සිටිය යුතුය.

03.ලංසු අයදුම්පත් 2025.05.29 දින සිට 2025.06.19 දින දක්වා පෙ.ව 9.00 සිට ප.ව 3.00 දක්වා ලබුදූව,දක්ෂිණපාය අධ්‍යාපන අමාත්‍යාංශයෙන් (බිම් මහල) ලබා ගත හැකිය. වැඩි විස්තර සඳහා අමාත්‍යාංශයේ මෙම අංකයට වැඩ කරන දින ඇමතීමෙන් ලබා ගත හැකිය. 091-2030700

04. මුද්‍රා තබන ලද ලංසු පත්‍රිකා 2025.06.20 පෙ.ව 11.00 ට පෙර ලැබෙන සේ ලේකම්, දකුණු පළාත් අධ්‍යාපන අමාත්‍යාංශය, දක්ෂිණපාය, ලබුදූව, ගාල්ල යන ලිපිනයට ලියාපදිංචි තැපැලෙන් එවීමට හෝ අතින් රැගෙන විත් ප්‍රධාන ගණකාධිකාරී නිල කාමරයේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටියට බහාලිය හැකිය. ප්‍රමාද වී ලැබෙන ලංසු ප්‍රතික්ෂේප කරනු ලැබේ.

05.ලංසු විවෘත කිරීම 2025.06.20 දින පෙ.ව 11.00 ට ලංසු පත්‍රිකා භාරගෙන අවසන් වූ වහාම දකුණු පළාත් අධ්‍යාපන අමාත්‍යාංශයේ ප්‍රසම්පාදන කමිටු සභාපතිගේ ප්‍රධානත්වයෙන් අමාත්‍යාංශයේදී සිදු කරන අතර එම අවස්ථාවට ලංසුකරුට හෝ ලංසුකරුගේ බලයලත් නියෝජිතයන් හට සහභාගී විය හැක.

06. ලංසුව සමඟ ඉදිරිපත් කරන ලංසු සුරක්ෂණය ශ්‍රී ලංකා වානිජ බැංකුවකින් දකුණු පළාත් අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම් නමට ලබා ගත් 2025.06. 20 දින සිට 2025.10.17 දක්වා වලංගු ලංසු ඇපකරයක් හෝ අධ්‍යාපන අමාත්‍යාංශයේ ගිණුම් අංශය වෙත මුදල් ගෙවීමෙන් අනතුරුව ලබාදෙන මුදල් කුවිතාන්සියේ මුල් පිටපත ලංසු පත්‍රිකාව සමඟ ඉදිරිපත් කළ යුතුය.

07. ලංසු වලංගු කාලය දින 91 කි.

08. ඉදිරිපත් කරනු ලබන කර්මාන්තයට අදාල ලංසු පිටපත් දෙකකින් යුතුව ඉදිරිපත් කළයුතු අතර **සෑම මිල ගණන් ඇතුලත් ලංසු පතකම ඒකක මිල ගණන් හා මුළු මුදල දැක්වෙන තීරය සහ සාරාංශය (වට්ටම් දැක්වෙන තීරයද ඇතුලත්ව) අවර්ණ සෙලෝටේප් කර ඉදිරිපත් කල යුතුය.** එහි මුල් පිටපතෙහි “ මුල් පිටපත“ යනුවෙන් සඳහන් කළ යුතු අතර අනු පිටපතෙහි “ අනුපිටපත“ යනුවෙන් සඳහන් කළ යුතුය. ලංසුපත් වල මුල් පිටපත හා අනුපිටපත වෙන වෙනම කවරවල බහා මුද්‍රා තබා එම කවර දෙක එක් කවරයක බහා එම කවරය මුද්‍රා තබා කවරයේ වම් පස උඩකෙළවරේ කර්මාන්තයේ නම සහ අංකය සඳහන් කළ යුතුය.

09.පූර්ව ලංසු රැස්වීමක් 2025.06.12 දින පෙ.ව 10.00 ට ගාල්ල,ලබුදූව , දක්ෂිණපාය, දකුණු පළාත් අධ්‍යාපන අමාත්‍යාංශයේ පළමු මහලේ රැස්වීම් ශාලාවේදී පැවැත්වේ.

10.අඩුපාඩු සහිත ලංසුපත් ප්‍රතික්ෂේප කරනු ලබන ලැබේ. මෙම ප්‍රසම්පාදනය සම්බන්ධයෙන් ප්‍රසම්පාදන කමිටුවේ තීරණය අවසාන තීරණය බව සැලකිය යුතුය.

ඒ.යූ.වේලාරත්න,

ප්‍රසම්පාදන කමිටු සභාපති,

දකුණු පළාත් අධ්‍යාපන අමාත්‍යාංශය,

පළමු මහල, දක්ෂිණාපාය, ලබුදූව, ගාල්ල.

2025.05.27

දුරකථන අංකය - 0912030700 ඊමේල් - acc.moesp@gmail.com